**විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව**

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2025.09.23
වේලාව :- පෙ.ව. 9.30

**සහභාගිත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
7. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
8. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
9. කේ.සී.සරත් කුමාර මැතිතුමා
10. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
11. ජේ.පී.පද්මසිරි මැතිතුමා
12. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
13. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
14. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
15. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
16. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
17. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
18. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
19. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
20. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
21. පී.ජී.මල්ලිකා මැතිතුමිය
22. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
23. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
24. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
25. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
26. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
27. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
28. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
29. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
30. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහභාගිත්වය**

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

**(ඊ).1.ii.** **සියඹලන්ගමුව වෙලමැද මාර්ගය කෑගල්ල දිසා අධිකරණයේ විභාග වන අංක 7267 දරණ බෙදුම් නඩුව අවසන් කිරිමට හෝ සමථ වීමට පැමිණිලිකාර පාර්ශවය කැමැත්ත ප්‍රකාශ කර ඇත.ඒ අනුව සභාවේ තීරණය දන්වන ලෙස නියෝග කර ඇත. ඒ අනුව අදාළ මාර්ගය සම්බන්ධව පහත කොන්දේසිවලට යටත්ව සමථ විමට එකඟතාවට ප්‍රකාශ කිරිම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහමමදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

**1.ගැසට් පත්‍රයේ සඳහන් මාර්ගය අඩි 6 ක් පළලින් යුක්ත බැවින් එම පළලට මාර්ගය පැවතිය යුතු බව**

**2.ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මංමාවත්වල බලතල හා කාර්යයන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ iii වන කොටසේ 21 වන වගන්තියේ සිට 77 වන වගන්තිය මගින් පළාත් පාලන ආයතනයට පැවරි ඇති බැවින් මතුයම් දිනක මෙම දෙවට සංවර්ධනය කර ප්‍රධාන මාර්ගය වෙත සම්බන්ධ කිරිමක් සිදු කළ හොත් ඒ සඳහා දෙවට දෙපස ඉඩම් හිමියන්ගේ මාර්ගයට අවශ්‍ය භූමි ප්‍රමාණය සමානව ලබා ගත යුතු අතර මෙම ඉඩම් හිමිකරුද ඒ සඳහා තම ඉඩමින් අවශ්‍ය ප්‍රමාණය ලබා දිය යුතුය.**

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

අද දවස කවුරුත් දන්නවා විශේෂ කටයුත්තක් ගැන සාකච්ඡා කිරීමටයි. එනම් සියඹලන්ගමුව වෙළමැද මාර්ගය කෑගල්ල දිසා අධිකරණයේ අංක 72/68 බෙදුම් නඩුව සමථ වීමට පැමිණිළිකාර පාර්ශවය කැමැත්ත ප්‍රකාශ කර ඇත. ඒ අනුව සභාවේ තීරණ ගන්නා ලෙස නියෝග කර ඇත. ඒ අනුව අදාළ මාර්ගය සම්බන්ධව පහත සඳහන් කරුණුවලට යටත්ව සමථ වීමට එකඟතා ප්‍රකාශ කිරීමට යෝජනා කරමි.

**1.**ගැසට් පත්‍රයේ සඳහන් මාර්ගය අඩි 6 ක් පළලින් යුක්ත බැවින් එම පළලට මාර්ගය පැවතිය යුතු බව

2.ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මංමාවත්වල බලතල හා කාර්යයන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ iii වන කොටසේ 21 වන වගන්තියේ සිට 77 වන වගන්තිය මගින් පළාත් පාලන ආයතනයට පැවරි ඇති බැවින් මතුයම් දිනක මෙම දෙවට සංවර්ධනය කර ප්‍රධාන මාර්ගය වෙත සම්බන්ධ කිරිමක් සිදු කළ හොත් ඒ සඳහා දෙවට දෙපස ඉඩම් හිමියන්ගේ මාර්ගයට අවශ්‍ය භූමි ප්‍රමාණය සමානව ලබා ගත යුතු අතර මෙම ඉඩම් හිමිකරුද ඒ සඳහා තම ඉඩමින් අවශ්‍ය ප්‍රමාණය ලබා දිය යුතුය.

මේ සඳහා අනවශ්‍ය ලෙස කාලය මිඩංගු නොකරමු. මොකද ඔබතුමන්ලා දන්නවා පසුගිය සතියේ පළාත් පාලන සතියට කාර්යාල කටයුතු බොහොමයක් අතපසු වුණා හා පිටත කටයුතු තිබුණ නිසා මේක ප්‍රාථමික මට්ටමට ගන්න එපා කියලා ප්‍රථමයෙන් ඉල්ලා සිටිනවා.මේක අපි කවුරුත් දන්නවා. මේක ගිය වතාවෙත් කථාකලා. ඔබතුමන්ලා ඒකට ගියා කියලත් පැවසුවාය. නැවත අනවශ්‍ය ප්‍රශ්න ඇසිමේන් වළකින ලෙස පළමුව ප්‍රකාශ කරන බව සඳහන් කරන ලදි. මේක ගැසට් පත්‍රයේ සඳහන් වෙලා තිබෙනවා. මේ ලිපි ගොනු මම සභාවට ගෙනාවා. මේක අවුරුදු 19 ක් තිස්සේ තිබෙන පරණ ප්‍රශ්නයකි. මේ මාර්ගය ප්‍රාදේශීය සභාව විසින් සංවර්ධනය කරන වෙලාවේ එක් ඉඩම් හිමියෙක් වන සිසිර කුමාර තමා අපට මේ නඩුව දමා තිබෙන්නේ, අවුරුදු 19ට පස්සේ ගරු අධිකරණය හා පැමිණිළිකාර පාර්ශවය එකඟවෙලා තිබෙනවා මේ නඩුව සමථයකට පත් කිරිමට හා මේ නඩුව අවසන් කිරීමට. අපිත් මේ නඩුවට අවුරුදු 19ක් සම්බන්ධ වෙලා තිබෙනවා, නැති අවස්ථා තිබෙනවා. ඒකට තමා ගරු අධිකරණයට මෙම සභාවට දන්වලා තියෙන්නේ. එතකොට මාස 3ට මෙහා තමයි ඒ තීන්දුව අරගෙන තිබෙන්නේ, ඊට පස්සේ සභාව පිහිට වූ නිසා ගරු අධිකරණය මහ සභාවේ නිර්දේශයක් ඉල්ලනවා මේක සමථයකට පත් වෙන්න තිබෙන කාරණා මොනවාද කියලා. ඒ අනුව තමයි මේ කාරණාව අපි සාකච්ඡාවට ගන්නේ. මෙතනදී ගැසට් පත්‍රයේ තිබෙනවා මාර්ගය අඩි 6ක් කියලා. අපි අනිවාර්යෙන් කියනවා මෙම මාර්ගය අඩි 6ක් තිබෙන්න ඕන කියලා. ඊළඟට මේක

සමථ වුණොත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මංමාවත් හා බලතල හා කාර්යන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ තුන්වන කොටසේ 21 වගන්තියේ සිට 70 වගන්තිය මඟින් පළාත් පාලන ආයතන වෙත පැවරි ඇති බැවින් මෙම දෙවට සංවර්ධනය කළ හොත් දෙවැට දෙපස ඉඩම් හිමියන් මාර්ගයට අවශ්‍ය ඉඩම් කොටස ප්‍රමාණය ලබාදිය යුතු අතර මෙම ඉඩම් හිමිකරුද ඒ සඳහා තම ඉඩමෙන් අවශ්‍ය ප්‍රමාණය ලබා දිය යුතුයි.යන කොන්දේසිය ගරු අධිකරණයට වාර්තා කිරිමට යෝජනා කරනවා.පසුගිය 07/21 දින සිසිර කුමාර කියන මහත්තයා සමඟ මෙම ගැටළුව පිළිබඳ සාකච්ඡා කරන ලදි.එහිදි දැනට ඉඩම ලබාදිම පිළිබඳ ගැටළුවක් නොමැති බව ප්‍රකාශ කරන ලදි.දැන් තිබෙන මාර්ගයට අකමැති නැත.එසේම ගුණරත්න මහතාගේ ඉඩම ඉදිරියට මාර්ගය සකස් කර ප්‍රධාන මාර්ගය වන කුදුම්බුව මාර්ගයට සම්බන්ධ වන මෙම මාර්ගය අඩි 10 ක් පළලින් මාර්ගය සැකසිමේදී මාර්ගය දෙපස පදිංචි සියලුම දෙනාගෙන්ම ඉඩම් ලබා දෙන්නේ නම් සමථය සම්බන්ධව තම එකඟතාවය පළ කරන ලදි යනුවෙන් ලිපියක් සඳහා අත්සන් කර ඇති බවට ගරු සභාපතිතුමා පවසන ලදි.එයට

ගරු සභාපතිතුමා,

සංවර්ධන නිලධාරිතුමිය වන D.P.K.G.පතිරණ මහත්මිය,

ඉන්දික සමන් කුමාර මන්ත්‍රීතුමා හා කැලුම් කුමාර මන්ත්‍රීතුමා සාක්ෂියට අත්සන් කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඉන්පසු උපාලි රෝහණ මන්ත්‍රීතුමා ක්ෂේත්‍ර චාරිකාවක් කළා එම නිසා ඔබතුමාට කථා කිරිමට අවස්ථාව සලසා දෙන බවට පවසන ලදි.

### ❖ ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා

ගරු සභාපතිතුමනි, ලේකම්තුමනි, අපි එදා ක්ෂේත්‍ර පරීක්ෂණයක් කළා. ඊට පස්සේ එම මාර්ගය කුදුම්බුව මාර්ගයට සම්බන්ධයක් නැත. අපේ කැලුම් මන්ත්‍රීතුමා ගිහින් කතා කළාම ඒ අය ඒක සම්බන්ධ කිරිමට කැමති බවත්,දැනට තිබෙන අඩිපාර සංවර්ධනය කිරිමට නොහැකිය.අඩි පාරෙන් තමා සම්බන්ධ වෙන්නේ ප්‍රධාන මාර්ගයට ඊට පහළින් කොටසේ එතැන වංගුවක් ගැනිම නොහැකිය. පහළින් තිබෙන ගෙදරක හරියටම ඒක මැද තිබෙනවා ලයිට් කණුවක් එම කණුව බැලුවොත් සාමාන්‍යයෙන් අංශක 90 කට තිබෙනවා.එම නිසා ඒ අය උඩ ඉඩම් කට්ටි දෙකෙන් දෙන්න කැමතියි. අරකට වැඩි කොටසක් යන්නේ ඒ නිසා කැමති වුණා. අනෙක් ගෙදර මං හිතන්නේ ගෙදර නෝනා හිටියේ එයා ටිකක් අකමැති වෙලා කැමති වුණා. ඊට පස්සේ කැමති වුණා. පහළ දී හමුවුණා ඉඩම් හිමියෙක් ඒ නඩුව දාපු කෙනාගේ සහෝදරයෙක් තමා හම්බවුණේ. එයා කිව්වා මේ මාර්ගය දිගටම සම්බන්ධ වෙනවා නම් ප්‍රාදේශී සභාවේ කියන ගාණට ප්‍රශ්නයක් නෑ අපේ ඉඩමෙන් වුණත් අපි දෙනවා.අපෙන් තමා වැඩිපුර යන්නේ. ඒ වගේම සංවර්ධන කටයුතු පටන් ගන්නවා නම් කුදුම්බුව මාර්ගයේ සිට පහළට තමා සංවර්ධනය කිරිමට ඒ අයගේ යෝජනාව වෙන්නේ.නැත්නම් අර ගෙවල් හිමියෝ පවසනවා ඒ අයගේ ගෙවල් ළඟට එනකොට මේ උත්සාහයේ අත් අරිනවා කියලා බයක් තිබෙනවා කියලා. කීහිප විටක්ම එසේ වුණ බව පවසන ලදි. ඒ අයගේ ගෙවල් ළඟට ආවට පසුව ඒ වැඩසටහනෙන් අයින් වෙනවා. එහෙම වෙන්නේ නැති බව පැවසුවා. ඒ අය කැමැත්ත දුන්නා කිරිමට එතකොට ප්‍රාදේශීය සභාවේ අපිට අවශ්‍ය ප්‍රමාණයට පාර පළල් කිරීමට දෙනවා නම් අපි මේ කටයුත්තට කරමු.යැයි ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

### ❖ ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ටී.එම්.බී.තෙන්නකෝන් මැතිතුමා

ගරු සභාපතිතුමනි, පසුගිය වාරයේ මේ ප්‍රශ්නය පැණ නැගුණා අවුරුදු 19 ක් මම හිතන්නේ පැත්තක හිටපු අපිට නඩුවට කැඳවපු පුද්ගලයා තමයි දැන් සාමයට කථා කරන්නේ. අපි අවුරුදු 19 ක් මෙම සභාවේ මුදල් වෙන්කරලා නඩුව කිව්වා. කවුද මෙකට වගකියන්නේ. වගකිවයුතු පුද්ගලයා තමයි අද සාමයට අපට කථා කරන්නේ කොච්චර පාඩුවක් තිබෙනවාද අපි කතා කරල බලමු ගරු සභාපතිතුමනි මේ නඩුවට මහජන

මුදල් සභාවෙන් කොච්චර වියදමක් කරල තියෙනවද කියලා.මේ නඩුව දැම්මේ පැමිණිලිකාරයාගේ උවමනාවට දැන් අපිට එකපාරටම කියන්ට නොහැකි. අපි සාමදානයට කැමතියි කියලා, දැන් ලක්ෂ ගාණක් සභාවවේ මහජන මුදල් වියදම් කරලා අද මෙතනට ඇවිල්ල තියෙන්නේ. අවශ්‍යතාවය තියෙන්නේ නඩුව දාපු කෙනාට තමයි මේක සාමදාන වෙන්න. අපි කියන්නේ යම්කිසි හේතුවක් ඇති මේ නඩුව කියන්නට එයාගේ ඉඩමෙන් පාර පළල් කිරීමට විරුද්ධව තමයි නඩුව දැම්මේ. අවුරුදු 19ක් ගිහිල්ලා දැන් කියනවා සමථ වෙන්න.අපි සමථ වෙනකොට අපිට බර ගාණක් ගිහිල්ලා තියෙන්නේ. ඒ නිසා මහජන මුදල් වියදම් කරලා නඩු කියපු නිසා එයා අපිට මුදල් ගෙවන්න ඕන. මම අත්දැකීමෙන් කියන්නේ වඩුවාදෙණියේ මිද්දෙණිය පාර අපි සංවර්ධනය කරගෙන යන කොට නඩුවක් දැම්මා. නඩුව දාලා පැමිණිලිකාරයා ඉදිරිපත් කළා මේක සමථ වෙන්න කියලා. හැබැයි සභාව සමථ වෙන්න නොහැකිය. මොකද නීත්‍යානුකූලව ඉඩම් හිමියන්ගෙන් කැමැත්ත පරිදි මේ කටයුතු කළේ නොබිඳු ඉඩමක මගේ කොටසින් මම දෙනවා කියලා තමයි එකඟතාවය වුණේ. නඩුවේදී ඔය වගේම සමථයකට කතා කළේ. මම විරුද්ධ වුණා. මහ සභාවේදී එකඟවෙන්න නොහැකියි කියලා. නමුත් ඒ කාලයේදී ලොකු බලයක් තිබුණා ආණ්ඩුව තුළ සභාපතිතුමා අත්තනෝමතිකව කටයුතු කළා. පසුකාලයකදී ලියුමක් එවනවා පැමිණිලිකාරයාට එක ලක්ෂ දාහතර දාහක් ගෙවන්න කියලා මොකද අපි සමාදාන වුණේ. එක් ලක්ෂ දාහතර දාහක් ගෙවන්න කියලා. මම විරුද්ධ වුණා. දෙන්න බෑ කිව්වා.පහසුව මට ලේකම් මහත්තයාට කථා කරලා පැවසුවා. මන්ත්‍රීතුමා එහෙම කරන්න එපා.මේක අපි ඉවරයක් කරමු.මම කිවා මම කැමති නැහැ කියලා නමුත් සභාපතිතුමනි, අපි ඒ මුදල ගෙවලා ප්‍රශ්නේ අයින් වුණා. ඒ වගේ අදත් මහජන මුදල් අවභාවිතා වෙයි.මම කියන්නේ මහජන මුදල් වියදම් කරලා ඒක අවභාවිතා කරන්න දෙනවද නැත්නම් අපි එයාගේ ඉඩම් කොටසින් ඒක කල්තියා ගන්නවද? එහෙනම්, අපි කැමතියි එක ප්‍රශ්නයක් නෑ. අනෙක් පැත්තෙන් කැමති නම් ඒකටත් අපි කැමතියි.වන්දියක් නැතත් කමක් නැත. අරයා දෙනවා නම් තමුන්නාන්සේලා කමිටුවක් වශයෙන් ගිහිල්ලා ඒ දෙපැත්ත කතා කරලා. හැබැයි වන්දියක් නොගෙන පාරෙන් කොටස් ලබා දීමට කැමැත්ත දෙනවා නම් පමණක් අපි ලෑස්තියි වන්දියක් නැතත් කුදුම්බුව මාර්ගය දක්වා සංවර්ධනය කරන්න. මම හිතුවා මහජන මුදලින් කරමු. ඒ අයගේ මුදල් අවශ්‍ය නැහැ හැබැයි ඉඩම් කොටස් හැම කෙනාම ලබා දෙන්න ඕන .ඒ අනුව මේක සමථ වෙනවා නම් ඒ කාර්යයට එකඟයි එහෙම නැතුව අනෙක් අයගේ ඉඩම් වලින් දෙන්නේ නෑ කියලා කියනවා නම් හැබැයි අපිට නඩුවට ගිය වියදම් මුදල් නැවත ලබා ගන්නේ නැතුව සමථ වෙනවාට අපි කැමති නැති බව ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ටී.එම්.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මම එතැන ක්ෂේත්‍ර පරීක්ෂණයක් කරන අතරතුරේදී කිසිම කෙනෙක් අපෙන් වන්දි බලාපොරොත්තුවෙන් වන්දි ඉල්ලුවේ නැත. අපි ඒ අයට මුලින්ම පැවසුවේ කුදුම්බුව මාර්ගයට සම්බන්ධ කරනවා. ඉඩම මැදින් ගිහින් බැලුවා, ඔයගොල්ලෝ කැමති නම් ඉස්සරවෙලා මිනුම් කටයුතු සිදු කරනවා. අපි මාර්ගයේ ප්‍රමාණයට. මිනුම් කටයුතු කරලා අදාල ප්‍රමාණය වෙන් කරගෙන පාර ලියාපදිංචි කරලා ඉන්පසුව තමයි අපි නීත්‍යානුකූලව වැඩ ටික කරන්නේ කියලා. අපේ කැලුම් මන්ත්‍රීතුමා හිටියා. ඒ අය අපෙන් වන්දියක් ඉල්ලුවේ නෑ එතන මාර්ගය අවශ්‍යතාවය දැඩිව තිබෙන නිසා ඒ අය වන්දියක් අපෙන් බලාපොරොත්තු වුණේ නැති බව ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු ලේකම්තුමාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, එදා පරික්ෂාව සඳහා රෝහණ මන්ත්‍රීතුමා සමග සහභාගි වීමට සිටියත් හදිසි අවශ්‍යතාවක් නිසා මට ඒ සඳහා සහභාගීන්ට නොහැකි විය. ඒ ගැන කණගා ටුව ප්‍රකාශ කරනවා.ප්‍රථමයෙන්ම, ඒ වගේම ගරු සභාපතිතුමනි,අපේ රෝහණ මන්ත්‍රීතුමා පවසන විදියට එතැනට ගියාට පස්සේ අපිට ඒ අය කැමති වෙලා තිබෙනවා. සභාවත් එක්ක මේ කටයුතු සහයෝගයෙන් කරගෙන යන්නට. ඒ වගේම අපි විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕන. අවුරුදු 19ක් පුරා පැවති මේ නඩුවේ අපේ තෙන්නකෝන් මන්ත්‍රීතුමා පැවසූ අන්දමට මෙහිදී සභාවක් විදිහට අපට වුණ මූල්‍යමය පාඩුවක් තිබෙනවා. එතකොට කවදා හරි හෝ මේ කාරණාව සම්බන්ධව විගණනයට අපි ලක් වුණොත්,ඒ සඳහා අපිට මුහුණ දෙන්න ඕන ආකාරයට ගරු අධිකරණයට අපි පිළිතුරු සපයන්න ඕන කියන අදහස තමා මගේ

තියෙන්නෙ.අපි මේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රදේශයේ ඒ මාර්ගය සම්බන්ධ වන පිරිස් අපිට සහයෝගය ලබා දෙන බවට පැවසුවා කියලා රෝහණ මන්ත්‍රීතුමා පැවසුවත්, අධිකරණය අපේ මතය ප්‍රකාශ කරන විට ඒ පුද්ගලයින් ප්‍රකාශ කරපු එක ලිඛිතව ලබාගන්න අවශ්‍යයි. කවදා හරි හෝ දැන් වුණත් මේක වෙනස් වෙලා දෙගොල්ල ආරවුල් වෙලා අදහස වෙනස් කර ගැනීමට පුළුවන.එම නිසා සමථයකට ප්‍රකාශ කරන විට ඒ ගැන අවධානය යොමු කරන්න ඕන කියන එක තමා මගේ මතය බව ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මන්ත්‍රීවරුනි, මේය අවුරුදු 19 ක් තිස්සේ ඇදී ගිය ප්‍රශ්නයක්. අපි සභාවක් විදිහට හරියට ප්‍රශ්නය විසඳන එක තමා හොඳ. තෙන්නකොන් මන්ත්‍රීතුමා පැවසූ අකාරයට මූලා පාඩුවක් වෙලා ඇති. නමුත් මේ ප්‍රශ්නෙ දිගින් දිගට ඇදෙනවාට වඩා සභාපතිතුමනි,මේක විසඳන එක තමා හොඳ, අපිට අධිකරණයට කරුණු වාර්තා කරන්නට වෙයි කවදා හරි. ඒ නිසා සිටින සියලුම අයගෙන් අපි ලිඛිතව ප්‍රකාශ ගන්න වෙයි. දැන් ප්‍රකාශ කරන කරුණු අනුව,ප්‍රාදේශීය සභා පනතට අනුව අපි ඒකට එකඟතාවය පළ කරනවා නම් හොඳ බවත්,මෙය දිගින් දිගට ඇදගෙන ඇවිත් අවුරුදු 19 ක් තිසසේ එන ප්‍රශ්නයක් විසඳන්නේ නැතිව ඇදගෙන යන එක තේරුමක් නැති නිසා මේකට අපේ තිබෙන පනත අනුව බලා අපි එකඟතාවය පළ කරමු. කියන අදහස ඉදිරිපත් කරන බවට ගරු ප්‍රාදේශීය මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බොහොම හොඳයි, අදහස් ප්‍රකාශ කළාට ගරු මන්ත්‍රීතුමන්ලා අපි එහෙනම් මේකට මෙහෙම තීන්දුවට යමු නේද? අර සිසිර කුමාරගෙන් ගත් ලිපිය .අනෙක් ලිපි ගත යුතුද? අධිකරණයට දෙන නිසා ලියුමක් ගත යුතු වෙයිද? එකක් ඕන නැති වෙයි. අපි දැන් තීන්දුවක්නේ දෙන්න ඕන.තීන්දුවක් නොවේ අපේ අදහසනේ දෙන්න ඕන. එතකොට ගැසට් එකේ තිබෙන අඩි 06 දෙන්න ඕන කියන එක ගැටළුවක් නොවෙයි.එතකොට අපි කියනවා අර ප්‍රධාන පාරට සම්බන්ධ වෙනවා නම් අවශ්‍ය භූමි ප්‍රමාණය අඩි 10 හා අඩි 12 ක් කියලා. ගරු අධිකරණයට. අඩි 10 කියලා ගැටළුවක් නැනේ. එතකොට කියන්නේ අවශ්‍යය භූමි ප්‍රමාණය සමානව ලබාගත යුතු අතර ඉඩම් හිමිකරු එයාගේ ඉඩමෙනුත් දෙන්න කියලා තමා කියන්නේ එතකොට අර කාරණයත් එකතු කරමු. ඔබතුමා මතු කරපු කාරණය යම්කිසි මුදලක් තියෙනවානේ මට එක දැන් සඳහන් කිරීමට නොහැකිය. ලිපිගොනු පරීක්ෂාව කිරීමෙන් පසු සඳහන් කිරීමට පුළුවන් බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

එහෙනම් අපි අඩි 10 හෝ අඩි 12 ක් ගනිමු.නැත්නම් අපිට නැවත නඩුවකට යන්න වෙන බව ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒක අපි ලබා ගත්තාට පසු කරමු නේද? යනුවෙන් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ටී.එම්.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඒක ගරු අධිකරණයේදී කියන ලෙස සඳහන් කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔව් උසාවියේදී අඩි 10 හරි අඩි 12 හරි ඉල්ලුම් කරමු. අපිට මිනුම් කටයුතු දැන් කරන්නට නොහැකිය. දැන් නඩුවක් තියෙන්නේ. දැන් මට දැනේන හොඳම දේ තමයි. අපි මේක කොලේ සඳහන් කර ඇති යෝජනා දෙකට අමතරව කරුණු ටික දමා ගරු අධිකරණයට යොමු කරමු මේකට යටත්ව සමථයකට පත්වෙන්න අපි කැමතියි කියලා. ගරු අධිකරණය මොකක් හරි නියෝගයක් ලබා දෙයි. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගමු. එහෙම හොඳයි නේද යනුවෙන් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

අපි ලිඛිත ප්‍රකාශයක් ගනිමු. අදහස් ප්‍රකාශය කිරිම ලිඛිතව ලබා ගැනිම හොඳයි. අපේ මතය ඉදිරිපත් කිරිමට මොකද බැරිවෙලා හරි කවුරු හරි කෙනෙක් අපි යම් හෙයකින් මේ පැමිණිල්ලකරුවෝ එක්ක ඔබතුමාගේ පෞද්ගලික සම්බන්ධතාවයකට අනුව මැදිහත් වෙලා සමථයකට පැමිණි බවට කියලා දෝෂාරෝපණයක් එල්ල වෙන්න ඉඩ තිබෙනවා. පැමිණිලිකාරයෝ එක්ක සාකච්ඡා කර ලිඛිත ප්‍රකාශයක් ලබා ගෙන අපේ මතය ප්‍රකාශ කරමු. පස්සේ අපිට කවදාහරි අපේ මේ කටයුතු සඳහා යනකොට අපිට වියදම් වීමක් වෙලා තියෙන බැවින් වන්දි ගෙවන්න අපට නැවත යන්න වෙයි නඩුවකට වන්දි ඉල්ලලා ඒ කෙසේ වෙතත් අපේ මහජනතාවගේ මුදල් වැය කර අධිකරණය වෙනුවෙන් සභාවක් විදිහට අධිකරණයේ පෙනි සිටි වෙලාවේ ඒකට වැය වූ මුදල් වලට අපිට විගණනයකදී ප්‍රශ්නයක් ඇති නොවන ආකාරයට අපේ මේ මතය ප්‍රකාශ කරමු. යනුවෙන් ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

මේ නඩුව ගොනුකර තිබෙන්නේ මාර්ගය සම්බන්ධ කර නොමැති වීම නිසාය. ඒ කියන්නේ මාර්ගය මුල සිට යනවා අනිත් අන්තයට ඒ අන්තයට මාර්ගය සම්බන්ධ වෙනකොට මුල සිට මාර්ගය කපනවා. අඩි 10 ට හෝ අඩි 12 ට හරි යම්කිසි ප්‍රමාණයකට එය ඉල්ලන ප්‍රමාණය වේ. නඩු දැමූ පුද්ගලයා විසින් එකඟතාවයකට එන්නේ නැත්තේ මාර්ගයේ අනෙක් අන්තයේ සම්බන්ධ නොකිරීමයි. මාර්ගය අනෙක් අන්තයට සම්බන්ධ වෙනවා නම් මේ පුද්ගලයා ඉඩමෙන් යන කොටස ලබාදීමට එකඟයි. නමුත් ඒ වෙලාවේ තීරණය කරලා නෑ. එහා පැත්තේ ඉඩමේ අයිතිය අරගෙන දෙන්න. නමුත් ඒ කට්ටිය මෙතන තීරණය අරගෙන තිබෙන්නේ පුද්ගලයාගේ ඉඩමෙන් අවශ්‍ය ප්‍රමාණය පවරා ගැනීමට පමණයි. එතකොට සභාවට වගකීමක් තිබෙනවා. මෙම නිවැරදි කර දෙන්න. ප්‍රශ්නය නිවැරදි කරන්නේ නැතුව අර පුද්ගලයකුට පටලලා තමා නඩුවට ගිහින් තියෙන්නේ. සභාවක් විදිහට මැදිහත් වෙලා අර අදාළ කණ්ඩායමෙන් මාර්ගය ගන්න එකකතාවයකට ගිහින් නැත. එහෙම ඒ තැනට යන්නේ නැතුව තමා මේ නඩු මාර්ගයට ගිහින් තියෙන්නේ. අවුරුදු 19කට පෙර ඒ වගේ තීරණයක් ගන්නේ නැතුව ඒ අදාළ පුද්ගලයා සමඟ මේ සභාව පැටලිලා තියෙන්නේ. දැන් අර අය එකඟතාවයකට එනවා මාර්ගය ලබා දෙන්න. ඒ එකඟතාවයට එද්දි තමා මේ තීරණය ගන්නේ මේ මාර්ගයේ අර පුද්ගලයා කියන්නේ එකඟතාවයට එනවා නම් ලැස්තියි කියලා. එයාගේ ඉඩමෙන්, එතකොට මෙතුමා කතා කරපු විදිහට වන්දි මුදලට යනවා නම් පාර නැතුව ගැටලුවක් වෙනවා. ඒ පැත්තේ මාර්ගයට කැමැත්ත ප්‍රකාශය කරලා මේ අන්තයේ සිට අනික් අන්තය දක්වා,මේකෙ අපට වන්දි මුදලක් ඉල්ලීම. ඒක සාධාරණ එක්ක නොවන බවත්, මාර්ගයට අවශ්‍යය ප්‍රමාණය ගොඩනැගෙනවානම් නමුත් පාර සම්බන්ධ වෙන්නේ නැතුව මේ නඩුව පවරපු පුද්ගලයා සමග එක්ක පාර කපන්න හදලා තියෙන්නේ. එයාගේ ඉල්ලීමට නඩුව කියනවා. ඒ නිසා තමයි. එයා නඩුවකට ගිහින් තියෙන්නේ. එතකොට ඉල්ලන්නෙ නැතුව ඔය පාර සම්බන්ධ කර ගත්තා නම් මේ නඩුවට යන්නේ නැතුව අනෙක් පාර්ශවයත් එක්ක සාකච්ඡා කරලා මේ පාර සම්බන්ධ කිරිමට ඒ කාලේ සභාව තීරණය ගත්තා නම් අවුරුදු 19කට කලින් නඩුවට යන්න ඕන නැත. ඒ වෙලාවේ සභාව තීරණය කරලා තියෙන්නේ ඉඩමෙන් අත්පත් කර ගැනීමට පමණයි. නමුත් පාර ගැන සාකච්ඡා කරලා නැත. එසේ සාකච්ඡා නොකරපු නිසා තමයි මේ පුද්ගලයා නඩුවකට ගියේ. ඒ නිසා සභාපතිතුමනි, ඒ ගැන සැලකිලිමත් වෙලා දැන් අර අයට ඒ ගැන කැමති ප්‍රකාශ කරනවා නම් ඒ අයට මේ මාර්ගයට ඉඩම් ප්‍රමාණය පවරන්න කැමතියි කියලා ඒ කැමැත්ත මත උසාවියට ඉදිරිපත් කිරිම සුදුසු බව යනුවෙන් ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

අපේ මන්ත්‍රීතුමා කියන විදිහට අවුරුදු 19 ට පෙර කියන්නට තිබුණු ප්‍රශ්නයක් නිසා කියලා තමා මේකේ කියන්නේ. හිඟන්නාගේ තුවාලය වගේ මේක පාර පාර ඉන්න ඕනේ නැත. දැන් මේක අවසන් වෙලා තියෙන වෙලාවේ සඳහන් කරන්න නොහැකිය සභාවක් විදිහට නිසි ක්‍රියාමාර්ග ගත්තද නැද්ද කියන එක

මේ මන්ත්‍රීතුමා දන්නවාද කියලා මම හිතන්නේ නැහැ. මොකද මේ සභාවට මේ ගැටලුව එන්න ඇත්තේ මීට අවුරුදු 19කට පෙර, ඔබතුමා දන්නෙත් නැතුව ඇති. අතීතයේ කොහොම ඒ සිද්ධිය සිද්ධ වුණාද කියලා. ඒ නිසා අපිට මේක නැවතත් අපි සභාව පැත්තට වැරැද්ද පවරා ගන්න එපා. මොකද හිටපු සභාපති කෙනෙක් හෝ ලේකම් කෙනෙක් හෝ මේ කරුණට අවශ්‍ය තීරණ ගන්න ඇති. නමුත් මොනයම් හේතුවකට අධිකරණ කටයුතුවලට තමා ගිහින් තියෙන්නේ. නමුත් අපි දැන් සාධාරණව අවසන් අදියරයට තමා ඇවිත් තියෙන්නේ. පස්සේ අධිකරණයට ගිය පැමිණිලි කරුත් මේක සමථයකට එනවා නම් අපිට සමථයකට යන්න පුළුවන්.අපි වන්දි ඉල්ලලා කියලා කියන්නේ අපට වියදම් වුණ සභාවක් විදිහට මහජනතාවගේ මුදල් වියදම් වුනා.ඒ නිසා සාධාරණයක් අපි ඉල්ලගන්ටත් ඕනේ. මොකද ඒක අපට විගණනයට මේක ප්‍රශ්නයක. ඒ නිසා මේක අපි වන්දි ඉල්ලන්නවද නැද්ද කියන එක එපා කියන තැනට යන්නට නොහැකිය.අපට ඇත්තටම ඒක පරණ ප්‍රශ්න දැන් මේ සභාවක් විදිහට හොයලා බලලා නැද්ද කියන එක දැන් අදාළ නැත. මේක අවසන් අදියරට ඇවිත් තියෙන්නේ. මේක තර්ක කරලා වැඩක් නෑ. හිටපු සභාපතිතුමා හෝ ලේකම්තුමා කරලා නැද්ද කියන එක අතීතයේ තිබෙන දෙයක්නේ ඇත්තටම මේ ක අවසන් අදියරේ තියෙන නිසා මේක ඉවරයක් කරගනිමු. විශේෂයෙන්ම සභාවක් විදිහට අපේ පැත්තට වරද පවරා ගැනීමට යුතු නැති බව ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

### ❖ ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා

ගරු සභාපතිතුමනි, මේක දාලා තියෙන්නේ එක පුද්ගලයෙක් මොකද අවුරුදු 19 ට පෙර සභාවක් විදිහට පාර සකස් කිරීමේදී මැනුම් කටයුතු කරගෙන ගැනිමට හෝ අත්පත් කරගැනීම යනවිට යම්කිසි පුද්ගලයෙක් මේකට විරුද්ධව කටයුතු කළා. ඒක අපිත් සම්බන්ධ විමට කටයුතු සිදු කරලා තිබෙනවා. මං හිතන්නේ මේකේ පාර්ශ්ව කරුවන් විදියට සභාවයි පැමිණිලිකරුයි විතරයි. වෙනත් පාර්ශවයක් විරුද්ධ නැත. මේකට ඉදිරිපත් වෙන්න ඕන නැත්නම් නඩුවක් දාන්න ඕන මං හිතන්නේ මේ පාර එවකට ගත්තු තීරණය අනුව සංවර්ධනය කිරීමේදී මැනුම් කටයුතු වලදී ඇති වූ ප්‍රශ්නයක් නිසා ඔහු අධිකරණයට ගිහින් තියෙන්නේ. සභාපතිතුමා ගරු මන්ත්‍රීතුමා කීවා වගේ මේකට අපි උසාවියට වාර්තා දීමට පෙර ඉදිරියේදී මං හිතන්නේ අපිට මේ සභාවේ පොදු අරමුදල් මහජන මුදල් වියදම් කරලා ඇත්තටම මේ නඩු ගාස්තු ගෙවලා තිබෙන්නෙ.ඒ නිසා මං හිතන්නේ ලේකම්තුමාට දන්වමු.පළාත් කොමසාරිස්තුමාගේ උපදෙස් අරගෙන කිරිමටත්, ඒකට සමථ වුණොත් අපිට අධිහාරයක් වුණොත් සභාවට හොඳ නැත.අධිකරණයට අවශ්‍ය ලිපි යන්නට පෙර පළාත් කොමසාරිස්ගේ උපදෙස් ගෙන අපට මේකෙදි සභාවක් විදිහට සමථයකට ගියොත් යම්කිසි කැලැල්ලක් ඇතිවේද නැති වෙයි ද යනුවෙන් උපදෙස් අරගෙන ක්‍රියාකරමු. යැයි ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

### ❖ ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ටී.එම්.බී.තෙන්නකෝන් මැතිතුමා

මම අර මන්ත්‍රීතුමා කියන එකට ඌණ පූර්ණයක් එකතු කරනවා. මාර්ගය සකස් කිරීමට යාමේදී නඩුව පවරා ඇත්තේ සභාවටයි. හැබැයි එතුමා කියන විදියට අනෙක් අයගෙ කැමැත්ත නැත්නම් විරුද්ධ වෙන්න තිබුණා. පැමිණිලිකාරයාට කොහොමද මෙයා අර්ථකතන කරන්නේ එයා විරුද්ධ වුණා කියලා විරුද්ධ වුනා කියලා කොතනකවත් සාක්ෂි නැහැ. මාර්ගය කැපිමට යනකොට එතැන ඉඳලා තමයි ඒ පැමිණිලිකරු විරුද්ධව නඩු දාලා තියෙන්නේ. ඒ අනුව තමා අපි නඩුවට වියදම් කරලා තියෙන්නේ. එපා කියනවා අනික් අය දුන්නේ නැති හින්දා වෙන්න ඇති කියලා දෙනවද නැද්ද කියන එක තීරණය කරන්නේ සභාවක් හැබැයි විරුද්ධව නඩු දාපු නිසා ප්‍රශ්නය තිබෙනවා පැමිණිකරු නඩු දානකොට අනෙක් ඉඩම් හිමියන් ටිකත් මේකට වග කියන්න ඕන. දැන් අපිට තියෙන්නේ අපි කතා කරන්නෙ අනෙක් ඉඩම් හිමියන් දෙන්නේ නෑ කියලයි. ඒක මෙතනට අදාල වෙන්නෙ නැත. ගරු සභාපතිතුමනි,අපේ මන්ත්‍රීතුමා කියනවා වගේ අපිට අධිහාරයක් ආවොත් අපට ඒකට ගෙවන්න නොහැකිය. අධිහාරයක් එනවා මේ ප්‍රශ්නය එක්ක බලන විට ඒ නිසා මගේ ඉඩම් කොටසේ යන ප්‍රමාණය දෙන්න කැමතියි කියලා එතුමා කියන්න ඕනේ. අනෙක් අයගේ ඉඩම් කොටස පෙන්විමට උවමනා නැත.මගේ කොටසින් මම දෙන්න කැමතියි.එහෙනම් සමථ වෙන්න අපි කැමතියි.එයාගෙන් වන්දි ඉල්ලන්නේ නැත. එහෙම එකඟ වෙනවානම් හොඳයි. නඩුව දානකොට අනේ සිටින අයටත් පුළුවන් නඩුව දාන්න. ඒ අයත් විත්තිකාරයන් කරන්න පුළුවන්. ඒ අය විත්තිකාරයා නොකර

අපි විත්තිකාරයන් බවට පත් කළා.විත්තිකරුවන් ඒක අපට මැදිහත් වෙන්න පුළුවන් නමුත් සභාව හරියට තීන්දු ගත්තද කියලා එදා ඒ නිසා මට කියන්නේ අපිට අලාභයක් වෙලා තියෙනවා. මහජනතාවගේ මුදල් නිසා ඒ අනුව අපි කැමතියි සමතයකට දැන් තියෙන තත්ත්වයට අනුව ඒ එහෙම නැතුව එතුමා විසින් පාර පළල විදිහට ඉඩ දෙනවා නම් අපි වන්දියක් අවශ්‍ය නැත.අපි කැමතියි ඒ පාර ඒ විදිහට සකස් කරනවා නම් යනුවෙන් ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ටී.එම්.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

අපට පැහැදිලි වෙන්න මේ මාර්ගයේ A අන්තයේ සිට යනකොට මෙම මාර්ගය සම්බන්ධ වෙන්නෙ නැත.A අන්තයේ සිට B අන්තයට යන අතරතුරේදී මේ B අන්තයේ නැවතිම නිසා නඩුව මාර්ගය ඉදිරිපත් වූයේ. ඒ කෙනාගේ ඉඩමෙන් ඒ ප්‍රමාණය මැනුම් කරන්න. හැබැයි ඒ ඉඩම් හිමිකරු පවසනවා. මෙම මාර්ගය පුළුල් කරන්න.ඒ වගේම මෙම මාර්ගය අනෙක් අන්තයට සම්බන්ධ වෙනවා නම් පමණයි. ඒක අධිකරණයට දැනුම් දෙන්න. මහජනතාව වෙනුවෙන් අපි ඉන්න ඕන. මහජනයට අවශ්‍යතාවයක් තිබෙනවා ප්‍රවාහනය. එතකොට මේ පුද්ගලයා එක්ක පැටලිලා නඩු දමලා තිබෙන්නේ යනුවෙන් ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ටී.එම්.බී.තෙන්නකෝන් මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා නඩුවක් නිසා අපට මැදිහත් වෙන්න නොහැකිය.සභාවට අධිකරණය අතගහන්න නොහැකි බවට පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

අධිකරණය අතගහන්න නොවෙයි.පවසන්නේ.යනුවෙන් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ඉහළ අධිකරණයට ගියානම් එතැනින් නතර වෙනවා.සමථ කරන්නට එකඟවෙලා තිබෙනවා.අනෙක් පුද්ගලයාගෙන් අපට අදාළ නැති බව ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපි වාද කිරීමට අවශ්‍ය නැත. මේක සභාවේ ප්‍රශ්නයක් නොවෙයි. අපි කාරුණික තීන්දුවක් ගන්නවා මිසක් වාද කර භේද කරන්නේ නැතුව මොකද ඉතිහාසයේ සභාව කොහොම තිබෙනවද කියලා අපි දන්නේ නැත. හැබැයි මොකක් හරි කරලා මෙතෙන්ට ගෙනාවා.වෙච්ච සිද්ධිය උත්තරේ අපට තිබෙන්නේ ඕන. අපිට සලකන්න වෙන්නේ ඉතිහාසයේ නඩුව පටන් ගත්තේ කොතනද ඒක හරිද වැරදි කියන එක නොවේ. ඒක ගෙනැල්ලා ගරු අධිකරණය අපෙන් ප්‍රකාශයක් ඉල්ලනකොට අපි බැදිලා ඉන්නවා. අපේ තීන්දුව ප්‍රකාශයට පත්කරන්න.ඒක නිසා කරන්න තියෙන්නේ ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා ඒකට උදව් කරන්න එක වාද කරගෙන මේකෙන් බේරෙන්න නොහැකිය.මොකද අධිහාර කතන්දරයක් එනවා. අපි ඒ වගෙන් බේරෙන්න ඕන.මොකද සභාවක් විදිහට අපි සියල්ලන්ගේම බේරෙන්න ඕනෑ.නැත්නම් අපි සිලුමදෙනාට ගෙවන්න වෙන්නේ. අපි සාමුහික තීරණයක් ගනිමු. අපි අධිකරණයට දෙන්න නොහැකිය කියලා ප්‍රතික්ෂේප කරලා එකෙන් අපිට බේරීමට නොහැකිය.මම කියන්නේ අපි කරුණු දක්වමු. අපි එය ළිහිල් කරන්නේ නැතුව සිටිමු. මොකද අපි යන්නේ මහජනතාවට සේවය කරන්න මාර්ග හදනවා, ඇළවල් හදනවා,මේවට ගියම

අපිට මුහුණ දෙන්න වෙන ප්‍රශ්න ටික ගැනි හිතන්න. ඉතින් එච්චර කරන්න ගිහින් නඩුවකට පැටලිලා ඇත්තේ මේ සිසිර කුමාර යන මහත්තයා හොයාගන්න බොහොම අමාරුවෙන් හැංගිලා හිටියේ. කැලුම් මන්ත්‍රීතුමා හොයා ගත්තේ එයා හොයාගෙන තමා ඇවිල්ලා 07/21 දින මම මේ කාර්යාලට ගෙනැල්ලා මේක අවුරුදු 19 ක් නඩුව කියලා එයාට අහම්බෙන දෙයක් නැති නිසා දැන් එයා වැටිලා ඉන්න නිසා එයාට මේකෙන් ගැලවෙන්න ඕන එයාට ගැලවෙන්න නම් අපි එයා පොඩි සහයෝගයක් දෙන්න ඕන.එතකොට මේ සියලු කරුණු සලකලා බලලා මෙකට හරි තීරණයක් ගන්න වෙනවා.

01. ගැසට් පත්‍රයේ සඳහන් මාර්ගය අඩි 6 ක් පළලින් යුක්ත බැවින් එම පළලට මාර්ගය පැවතිය යුතු ය.
02. මාර්ගය පළල් වෙනවා නම් ඒ සම්බන්ධ ඉඩම් වලින් අවශ්‍ය භූමි ප්‍රමාණය සමානව දිය යුතුය. අතර මෙම ඉඩම් හිමිකරුද ඒ සඳහා තම ඉඩමින් අවශ්‍ය ප්‍රමාණය ලබා දිය යුතුය.
03. මෙතෙක් අපි නඩුවට වියදම් කරපු නඩු ගාස්තු සභාවට ලබා දිය යුතුය.

ඉහත කරුණ අනුව සමථ විමට එකඟතාවය සභාව විසින් පළකර සිටි බවට ගරු සභාපතිතුමා සභාවට දන්වන ලදි.එතකොට අපේ පද්මසිරි මන්ත්‍රීතුමා පැවසු කාරණය ගරු අධිකරණය පැමිණි පාර්ශවයට පෙන්වා දෙයි.ඔහුට අසාධාරණය වුණා කියලා. එයාගේ වැඩක් එක අධිකරණය අපට ප්‍රශ්නය පැහැදිලිව කියලා තියෙන්නේ.අධිකරණයට ප්‍රකාශයක් ලබාදීම විතරයි. එය 8/05 දෙන්න කියලා දන්වා තිබෙන්නේ. එදා අපිට දෙන්න බැරි වුණ නිසා මහා සභාවේදී යොදා ගත්තේ වෙනම මේ කාරණාව අවසන් කරන්නට.එම නිසා මෙසේ හොඳ බවත්, මන්ත්‍රීතුමන්ලාගේ විරුද්ධතිවයක් නොමැති බවත්, ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ටී.එම්.බී.තෙන්නකෝන් මැතිතුමා**

අපේ නීතිඥ මහතාගෙන් උපදෙස් පැතිම සුදුසු බව ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ටී.එම්.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපි මේක දැන්නුවා.එතුමා එකඟතාවය පළ කළා.නමුත් සභායට ඉදිරිපත් කර අනුමතය ගැනිමට අවශ්‍ය නිසා සභාවට මේ යෝජනාව ලබා දුන්නේ කොන්දේසි තුනට යටත්ව අපි මේකට සමථ වෙන්න කැමතිය.එහෙත් ඒ තීන්දුව ඒ ආකාරයට ප්‍රකාශයට පත් කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

අඩි 12 ක් ලබා ගන්නවා නම් තක්සේරු මුදල් අයකර ගැනිම කළයුත බවත්,ගැසට් එකේ තිබෙන්නේ අඩි 06 ක්. අපි සමථයකට එන්නේ අඩි 06 ට නමුත් නැවත ඉල්ලුවොත් නඩුවකට යන්න වෙන බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේය ගැසට් එකේ තිබෙනවා. ගැසට් එකේ තිබෙන අඩි 06 ක් තිබෙන්න ඕන.මතු යම් දිනයක දෙවැට සංවර්ධන කරනවා නම් ඒ සදහා කරුණු යොමු කර 7/21 දින ලිපයක් ලබා ගෙන සාක්ෂිකරුවන් හතර දෙනෙක් අත්සන් යොදා ඇත.අවුරුදු 19 ක් පුරා නඩුවට සභාවට වියදම් වු නඩු ගාස්තු ලබා ගැනිමට අපි

ගණන් බලා සහකාර කොමසාරිස්තුමාගේ උපදෙස් අනුව ප්‍රකාශට පත් කරන බවත්,එය කිසිම කෙනෙකුගේ විරුද්ධත්වයක් නොමැති බවත් සභාවට ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒක මතිකව සභා සම්මත විය.

තීරණය-

01.ගැසට් පත්‍රයේ සඳහන් මාර්ගය අඩි 6 ක් පළලින් යුක්ත බැවින් එම පළලට මාර්ගය පැවතිය යුතු ය.

02.මාර්ගය පළල් වෙනවා නම් ඒ සම්බන්ධ ඉඩම් වලින් අවශ්‍ය භූමි ප්‍රමාණය සමානව දිය යුතුය. අතර මෙම ඉඩම් හිමිකරුද ඒ සඳහා තම ඉඩමින් අවශ්‍ය ප්‍රමාණය ලබා දිය යුතුය.

03.මෙතෙක් අපි නඩුවට වියදම් කරපු නඩු ගාස්තු සභාවට ලබා දිය යුතුය.

**වෙනත්**

රඹුක්කන පෙර පාසලේ සිඟිති දරුවන්ගේ අත්කම් නිර්මාණ ප්‍රදර්ශනයක් හෙට දින පැවැත්වෙන බැවින් ඒ සඳහා පොදු ආරාධනාවක් සිදු කරන ලෙස මා වෙත දන්වා ඇති බවත්,2025.09.24 දින පෙ.ව 9.00 -ප.ව1.00 දක්වා පොත් ප්‍රදර්ශනයක් රඹුක්කන පුස්තකාලය මඟින් පවත්වන බැවින් ඒ සඳහා සියලුමදෙනාට සහභාගි වීමට ආරාධනා කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**අවසානය**

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ,ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු පෙ.ව 10.20 ට පමණ අවසන් කරන ලදී.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව,